ශ්‍රී ලංකාවේ විශාලතම ගුවන් විදුලි පද්ධතිය
*The Largest Audio Network in Sri Lanka*

# ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව
## இலங்கை ஒலிபரப்புக் கூட்டுத்தாபனம்
## SRI LANKA BROADCASTING CORPORATION


e-mail: slbc@srilanka.net
Fax: 94-11-2695488/2697150/2691987

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box. 574

දුරකථනය (මාර්ග 5) / தொலைபேசி (5 இணைப்புகள்) / Telephone (5 Lines) 94-11-2697491-95


මගේ අංකය/எனது இல./ My No.: ..........................................

සෘජු දුරකථනය/தொலைபேசி./Direct Telephone

ඔබේ අංකය/உமது இல./ Your No.: ..........................................

ෆැක්ස්/பக்ஸ்./Your Fax.: ..........................................

Date. 2020.03.16

ලේකම්,
ජනමාධ්‍ය අමාත්‍යාංශය,
ඇසිදිසි මැදුර,
නාරාහේන්පිට.

ලේකම්තුමනි,

<u>"රේඩියෝ ගුරුවරයා මහ නොහැර පාසලට"</u>

<u>සියලු පාසල් සිසුන් සඳහා විශේෂ අධ්‍යාපනික වැඩසටහන් මාලාවක්</u>

<u>ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සියලුම නාලිකා මගින්</u>

රටතුළ උද්ගත වී ඇති සෞඛ්‍ය තත්ත්වය හමුවේ අධ්‍යාපන කටයුතුවල නියැලී සිටින සියලු පාසල් සිසුන් වෙනුවෙන් අධ්‍යාපනික වැඩසටහන් මාලාවක් ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සියලු නාලිකා මගින් හෙට (17) සිට විකාශය කිරීමට තීරණය කර ඇත.

සියලු පාසල් සිසුන්ට සම්බන්ධ විය හැකි ආකාරයට මෙම වැඩසටහන් මාලාව ඉදිරිපත් කරන අතර විෂය කරුණු සහ ඊට සම්බන්ධ ප්‍රශ්නෝත්තර ඉලක්ක කර ගනිමින් මෙම වැඩසටහන් විකාශය කරනු ලබයි.

ඒ අනුව ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සිටි එෆ්.එම්.නාලිකාව (එෆ්.එම්. තරංග මාලා 89.6/89.8) ස්වදේශීය සේවය(එෆ්.එම්. තරංග මාලා 91.7/91.9) වෙළඳ සේවය (එෆ්.එම්. තරංග මාලා 94.3/94.5) තෙන්ඩ්‍රල් නාලිකාව (එෆ්.එම්. තරංග මාලා 104.7/104.9) හා රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව (එෆ්.එම්. තරංග මාලා 97.4/97.6) ඔස්සේ මෙම වැඩසටහන් මාලාව ප්‍රචාරය කෙරේ. ප්‍රවීණ ගුරු මණ්ඩලයක් සහ දේශකවරු මෙයට සහභාගි කර ගැනෙති. පහත පරිදි මෙම අධ්‍යාපන වැඩසටහන් ප්‍රචාරය කිරීමට සැළසුම් කර ඇත.

| නාලිකාව | ශ්‍රේණි/විභාග | වේලාව (සඳුදා සිට සිකුරාදා දක්වා) | දේශක |
|---|---|---|---|
| සිටි එෆ්.එම්.නාලිකාව (89.6/89.8) | අ.පො.සද.උ.පෙළ විෂයන් සඳහා | 0800-1230<br>1500-1800 | සිංහල සාහිත්‍ය සහ රසාස්වාදය<br>ධම්මික බණ්ඩාර<br>නිලන්ත විමලසේන |
| වෙළඳ සේවය (94.3/94.5) | හය ශ්‍රේණියේ සිට අ.පො.ස. සා.පෙළ විභාගය දක්වා | 0900-1000<br>1300-1400 | ගණිතය -<br>ජයන්ත විජේරත්න<br>සිංහල -<br>ආනන්ද දිසානායක |
| ස්වදේශීය සේවය (91.7/91.9) | පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය දක්වා | 1000-1100<br>1600-1730 | සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලයේ ආචාරිනි සුභානි පල්ලෙවෙල මිය<br>ගයානි දේවරාජා මිය |
| තෙන්ඩ්‍රල් නාලිකාව (104.7/104.9) | අ.පො.ස. උ.පෙළ විෂයන් සඳහා | 0930-1100 | දෙමළ -<br>බී.ශාන්තකුමාර් මයා<br>ඉංග්‍රීසි -<br>රංජිත් හේමචන්ද්‍ර මයා<br>භූගෝල විද්‍යාව -<br>ආචාර්ය ෆ.රීනා රුෂයික්<br>බයෝලොජි -<br>එස්. ශර්වානන්දන් මයා<br>දේශපාලන විද්‍යාව -<br>එම්. ෆස්ලාන් මයා<br>ටී. උදයචන්ද්‍රන් මයා |
| | අ.පො.ස. සා.පෙළ විභාගය සඳහා | 1100-1200 | දෙමළ -<br>වී. මහේන්ද්‍රන් මයා<br>ගණිතය -<br>එම්. රාජේන්ද්‍රන් මයා<br>විද්‍යාව -<br>එම්.කෝගුල් මයා<br>වානිජ්‍ය -<br>එස්. ක්‍රිෂ්ණලීලා මිය<br>ඉංග්‍රීසි -<br>රංජිත් හේමචන්ද්‍ර මයා<br>(අවශ්‍යතාවය පරිදි) |
| දෙමළ ස්වදේශීය සේවය (102.1/102.3) | හය ශ්‍රේණියේ සිට දහය ශ්‍රේණිය දක්වා<br><br>පළමු ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය දක්වා | 1600-1700<br><br>1700-1730 | කේ. සුදර්ශන් මයා<br>එම්. සහාන් මයා<br>එම්.ක්‍රිෂ්ණවතාසන් මයා<br>එම්.මහේන්ද්‍රරාජා මයා<br>ටී.රාජවරාවහන් මයා<br>(අවශ්‍යතාවය පරිදි) |

| | | | |
|---|---|---|---|
| රේඩියෝ ශ්‍රී ලංකා නාලිකාව (97.4/97.6) | සාමාන්‍ය පෙළ විභාගය සඳහා ඉංග්‍රීසි සාහිත්‍ය<br><br>උ.පෙළ විභාගය සඳහා ඉංග්‍රීසි | 1400-1500<br><br>1600-1800 | මාරියෝ විජේවර්ධන මයා<br><br>සබ්‍රිනා සවාහිර් මිය |

මීට අමතරව සංගීත විෂය පිළිබඳ අධ්‍යාපන වැඩසටහන් මාලාවක් දිනපතා ප.ව.1.00 සිට විකාශය කිරීමටද සැළසුම් කර ඇත.

පාසල් දරුවන්ට, ගුරුවරුන්ට හා වෙනත් උපදේශකවරුන්ට අවශ්‍ය උපදෙස් ලබාදීමට හා ලබාගැනීමට පහත දුරකථන අංක ඇමතිය හැකිය.

| | |
|---|---|
| **සිටි එෆ්.එම්. නාලිකාව**<br>011 2 691992<br>011 2 676567 | **තෙන්ඩ්‍රල් නාලිකාව**<br>011 2 676464<br>011 2 676868 |
| **ස්වදේශීය සේවය**<br>011 2 682411 | **දෙමළ ස්වදේශීය සේවය**<br>011 2675976 |

මෙම පාඩම් මාලා www.slbc.lk වෙබ් අඩවිය ඔස්සේ සහ ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ YouTube නාලිකාව සහ Facebook පිටුව මගින් ලබාගැනීමට ද පහසුකම් සලසා ඇත. මෙම පාඩම් මාලාවන්ට නිවසේ සිටින සිසුන් යොමු කර ඔවුන්ගේ අධ්‍යයන කටයුතු සඳහා අවස්ථාව සලසන මෙන් සියලුම ගුරුවරුන්, දෙමව්පියන් සහ අධ්‍යාපන බලධාරීන් දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමි.

ස්තුතියි,

චන්ද්‍රපාල ලියනගේ,
අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව.